# අලිපැංචෙත් එක්ක පුංචි ගමනක්



ඩබ්ලිව්.ඒ. යෙසාරා සේනුලි හේරත් වික්‍රමආරච්චි

# අලිපැංචත් එක්ක පූංචි ගමනක්

ඩබ්ලිව්.ඒ. යෙසාරා සේනුලි හේරත් වික්‍රමආරච්චි

**අලි පැංචත් එක්ක පුංචි ගමනක්**

කර්තෘ ප්‍රකාශනයකි

පළමුවන මුද්‍රණය 2023 ඔක්තෝබර් 15


කතාව සහ චිත්‍ර

**ඩබ්ලිව්.ඒ. යෙසාරා සේනුලි හේරත් වික්‍රමආරච්චි**

5 ශ්‍රේණිය E

මහාමායා බාලිකා විදුහල

ISBN 978-624-206-702-5



**<u>පිදුම</u>**

ආදරණීය

අම්මා, අප්පච්චි, නංගිටත්,

5E ශ්‍රේණියේ තිලකරත්න ගුරු පියාණන්ටත්,

යෙහෙළියන්ටත්, සිප්සතර කියාදෙන

මහාමායා බාලිකා විදුහල් මෑණියන්ටත්

සෙනෙහසින් පුදමි.

යෙසාරා සේනුලි

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකූර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි.  දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම් මහතාගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර,
විදුහල්පතිනිය.
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.
2023 .10 . 20

එකෝමත් එක දවසක මෙන්න මේ වගේ දෙයක් සිද්ධ වෙලා, මම ආසාවෙන් බලා හිටිය අගෝස්තු දළදා පෙරහැර සමය පටන් ගත්තා. වෙනදා වගේම හැමෝම දළදා පෙරහැර බලන්න ලෑස්ති වෙනවා.





මමයි, අම්මයි, අප්පච්චියි, නංගියි
පෙරහැර බලන්න යන්න ලෑස්ති වුණා.
ටිකක් වේලාසනින් ගිහින් මළුවේ ඉඩක්
වෙන් කරගෙන අපි වාඩි උනා.


අම්මෝ .......... පෙරහැර
බලන්න පුදුම සෙනඟක්.

පෙරහැරේ ආරම්භක වෙඩිල්ල
පත්තු වුණා. දෙවැනි වෙඩිල්ලත්
පත්තු වුණා. හැමෝ බැලුවා
වෙඩිල්ල ආවේ කොහෙන් ද කියලා.
අප්පච්චිගෙන් මම ඇහුවා
වෙඩිල්ලේ කතාව.
"කරඬුව ගෙනියන ඇතා
වාහල්කඩ
ලඟින් කකුල
පඩිය උඩට
තියන කොටම
වෙඩිල්ල
දානවා "
අප්පච්චි
කිව්වා.




කසකරුවන්ගෙන් පටන් ගත්ත
පෙරහැරේ කොඩි ගෙනියන අය,
බෙරකරුවන්, නැට්ටුවෝ , ඇත්තු,
නිලමේවරු ලස්සනට ගමන් කරනවා
බලන් ඉන්න හරිම ලස්සනයි.
මාලිගාවේ පෙරහැර අවසන් වුණා.
දේවාලවල පෙරහැර පටන් ගත්තා.







අනේ ........... මෙන්න චූටි අලි පැටියෙක් එනවා, එයා එන්නේ හරියට පුංචි බෝලයක් පෙරලෙනවා වගේ. පුංචි අලි පැටියා හිමීට හිමීට මගේ ළඟට ළං වුණා. මොකක්ද රහසක් කියන්න වගේ. මම එයාව අත ගෑවා. එයා කන් දෙක හෙම්හිට නටවන්නට වුණා.

ඒත් එක්කම වගේ වුනේ නොසිතූ දෙයක්. පුංචි ළමයි ගොඩාරියක් පුංචි අලි පැටියා අත ගාන්නට වුණා. එයාට ඒක කරදරයක් වගේ. පුංචි අලි පැටියා දුවන්න පටන් ගත්තා. මමත් පස්සෙන් දිව්වා. මට අහුවුනේ අලි පැංචාගේ නැට්ට. ඒත් ඌ දුවන එක නතර කලේ නැහැ. මාවත් ඇදගෙන මෙන්න දුවනවා.



මමත් නතර වුණේ නෑ. අලි පැංචා රැජින හෝටලයත් පසුකරලා මාවත් ඇදගෙනම දුවනවා. මමත් නැට්ටේ එල්ලිලා යනවා. හතරවටේම කට්ටිය කෑ ගහනවා. මම නැට්ට තද කරලා අල්ල ගත්තා. ඒත් ඊට වඩා එල්ලිලා යන්න මට ශක්තියක් ඇත්තෙම නැහැ.



මගේ අතින් පුංචි අලි පැටියාගේ නැට්ට අතහැරුණා. මම වැටුනා. කොන්දත් ඇණුනද මන්දා. මට හොඳටම අමාරුයි. මං ඇඬුවා හයියෙන්. ඒත් එක පාරටම අම්මාගේ කටහඬ ඇහුණාම මගේ හිතට පුංචි සතුටක් ගෙනාවා.



"ඇයි පුතේ අඬන්නේ" අම්මා
ආදරයෙන් ඇහුවා. අනේ
එතකොටයි මට දැනුනේ මම දැකලා
තියෙන්නේ හීනයක් බව. හැබැයි
ඉතින් මම ඇඳෙන් බිමට වැටිලා.
මට ඇඬුනා ටිකක්.





ඒත් ඉතින් පුංචි
හිනාවකුත් ආවා
මට.

හින ලෝකේ අලි
පැංචා එක්ක ගිය
ත්‍රාසජනක ගමන
සුන්දරව සැබෑ
ලෝකෙත් මට යන්න
තිබුණා නම්........

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට<br>
සෙනෙවිරත්න මහලේකම්<br>
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ<br>
2023.10.20